# 22 වැසිකිළි භාවිතයේදී අනුගමනය කලයුතු දෑ



## (1) සන්මු නගරයේ පවතින වැසිකිළි වර්ග

**ජපානයේ පවතින වැසිකිළි වර්ග දෙකක් ඇත.**

① <u>විෂබීජ නාශක ටැංකිය ( *Jōkasō* )</u> භාවිතා කරනවැසිකිළි

( මළමුත්‍රා සහ එයින් සේදී යන අපිරිසිදු ජලය පොළොවයට බස්සා ඇති විෂබීජ නාශක ටැංකියකට යැමට සළස්වා ඇත. ) මෙම ටැංකිය අපිරිසිදු දෑ පිරිසිදු කිරීම සඳහා ඇති විෂබීජ නාශක ටැංකියක් වන අතර එය පොළොව යට වළලා ඇත.

② මළමුත්‍රා එක්රැස් කරගෙන යනු ලබන වැසිකිළි ( *Kumitoru Toire* )

( මෙම වර්ගයේ වැසිකළි වල බිම කුඩා වර්ගයේ ටැංකියක් වළලා ඇත. )

ඔබගේ නිවසේ සදා ඇති වැසිකිළිය කුමන වර්ගයකට අයත් දැයි පරික්ෂාකර බලන්න. වැසිකිළි වර්ගය කුමක්දැයි දැනගත් පසු පහත සඳහන් ආකාරයට වැසිකිළිය පිරිසිදු කර ගැනීම සඳහා සුදුසු ආයතනයකට දැනුම් දිය යුතුය.



## (2) වැසිකිළිය භාවිතා කිරීමේදී අනුගමනයකළයුතු අනුපිළිවෙල

① <u>විෂබීජ නාශක ටැංකිය ( *Jōkasō* )</u> භාවිතා කරනවැසිකිළි

<u>විෂබීජ නාශක ටැංකිය ( *Jōkasō* )</u> <u>පරීක්‍ෂා ( *Tenken* )</u> කර බලවා, කරුණාකර එය පිරිසිදු කරවාගන්න.

මෙම ටැංකිය <u>පරීක්ෂණය ( *Tenken* )</u> ට භාජනය කළයුතු වාර ගණන රටේ නීතිරීති වලට අනුව තීරණය කර ඇත.

<u>පරීක්ෂණය ( *Tenken* )</u> ට භාජනය කරන අවස්ථාවේ දීම <u>විෂබීජ නාශක ටැංකිය ( *Jōkasō* )</u> ද පිරිසිදු කරවා ගත යුතු ය.මෙය පිරිසිදු කිරීම එක්වරකට වඩා කළයුතු වේ.

මෙම ටැංකිය පිරිසිදු කරවා ගැනීමේදී පහත සඳහන් සේවා ස්ථානයටදුරකථනයෙන් අමතා මෙහි සඳහන් ආකාරයට කටයුතු කලයුතුයි.

මෙම සේවා ස්ථානයෙන් ටැංකිය <u>පරීක්‍ෂා ( *Tenken* )</u> කරවා ගැනීමද සිදුකරාව ගත හැක.

ටැංකිය <u>පරීක්‍ෂා ( *Tenken* )</u> කරවා ගැනීම සහ එය පිරිසිදු කරවා ගැනීම සඳහා වැයවන මුදල ඔබ විසින් ගෙවිය යුතු වේ.

| වැසිකිළි පිරිසිදු කිරීමේ සමාගම් | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|
| ඉගරෂි ෂෝකයි ( *Igarashi Shōkai* ) | 171,සෙකිෂිතා,තෝගනෙ<br>( 171,Sekishita, Togane-shi ) | 0475-58-5249 |
| ෂින්කෝ ඕතාමනේජිමෙන්තො කෝගියෝ<br>( *Shinkō Wotā Manejimento Kōgyō* ) | 315-5,කතොකු,තෝගනෙ<br>( 315-5,Katoku, Togane-shi ) | 0475-54-2231 |
| කන්කියෝ එඉසෙඉ සෙන්තා<br>( *Kankyō Eisei Sentā* ) | 592-1,හිරොසේ,තෝගනෙ<br>( 592-1,Hirose, Togane-shi ) | 0475-58-2304 |
| වතනබෙ සෙයිසෝ ( *Watanabe Seisō* ) | 323-18,හිගෂිනකා,තෝගනෙ<br>( 323-18,Higashinaka,Togane-shi ) | 0475-58-3308 |

| වැසිකිළි පිරිසිදු කිරීමේ සමාගම් | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|
| කයිජෝ කසෝ ( *Kai Jōkasō Sābisu* ) | 513-1,ෂිහොසොකුසා,ඕඅමිශිරසතෝ ( 513-1,Hosokusa, Oamishirasato-shi ) | 0475-77-1717 |
| *නරුතෝ ජෝකසෝ සෙන්තා ( Narutō Jōkasō Sentā )* | 703-1,ත්සුබෙ,සන්මුනගරය ( 703-1,Tsube, Sammu-Shi ) | 0475-82-0202 |

මීට අමතරව වසරකට එක වතාවක් <u>විෂබීජ නාශක ටැංකිය ( *Jōkasō* )</u> පරීක්ෂණයට භාජනය කරවා ගැනීම ජපානයේ නිතිරීති යටතේ තීරණය කර ඇත.වැඩි විස්තර සඳහා කරුණාකර වෙබ් අඩවිය පරීක්ෂා කර බලන්න.

චිබා ප්‍රාන්තයයේ වෙබ් අඩවිය

<u>https://www.pref.chiba.lg.jp/suiho/kasentou/joukasou/houteikensa.html</u>

② මළමුත්‍රා එක්රැස් කරගෙන යනු ලබන වැසිකිළි ( *Kumitoru Toire* )

මළමුත්‍රා එක්රැස් කරගෙන යනු ලබන ( *Kumitoru* ) වර්ගයේ වැසිකිළි භාවිතා කිරීමේදී නගරසභාවේ ලියාපදිංචි කිරීම අවශ්‍ය වේ.

නගරසභාවේ ＜ පරිසර සංරක්ෂණ අංශය ( *Kankyō Hozenka* ) ＞ ට යට ගොස් ලියාපදිංචි වියයුතුයි.

පහත සඳහන් සමාගම් විසින්ද මළමුත්‍රා එක්රැස් කරගෙන යනු ලබයි.

| වැසිකිළි පිරිසිදු කිරීමේ සමාගම | දුරකථන අංකය |
|---|---|
| ඉගරෂි ෂෝකයි ( *Igarashi Shōkai* ) | 0479-82-3586 |

මළමුත්‍රා එක්රැස් කරගෙන යන කාර්යය සඳහා මුදල් වැයවේ.

ඔබ විසින් ඒ සඳහා වැයවන මුදල් ගෙවියයුතු වේ.

මුදල් ගෙවීම සඳහා අවශ්‍ය වන බිල්පත මාස දෙකකට වතාවක් තැපැල් මගින් ඔබගේ නිවසට එවනු ලැබේ.

මුදල් ගෙවීම අමතක වුවොත් මළමුත්‍රා එක්රැස් කරගෙන යනු ලබන ( *Kumitoru* ) සේවාව සිදු කරනු නොලැබේ.කරුණාකර අමතක නොකර මේ සඳහා වැයවන මුදල් ගෙවා අවසන් කරන්න.






මුදල් ගෙවීමට ඇති රිසිට්පත

මළමුත්‍රා එක්රැස් කරගෙන යනු ලබන ( *Kumitoru* ) සේවය අත් හිටුවීමේදී නැවත නගර සභාවට ගොස් < පරිසර සංරක්ෂණ අංශය ( *Kankyō Hozenka* ) > ට අනිවාර්යයෙන්ම එම සේවයෙන් ඉවත් වීම සඳහා වූ ඉල්ලුම් පත් පුරවා භාරදිය යුතු වේ.

*< නගරසභාවට යනවිට රැගෙන යායුතු දේ >*

ජපානයේ හැඳුනුම්පත ( *Zairyū Kādo* ) ඔබගේ නම සහ ලිපිනය සඳහන් කිරීමට හැකි හැඳුනුම් පතක්







— සටහන් —

◎ 78 සහ79 වෙනි පිටුවේ අමාරු වචන◎

※විෂබීජ නාශක ටැංකිය ( *Jyōkasō* ) : මළමුත්‍රා සහ එයින් සේදී යන අපිරිසිදු ජලය පිරිසිදුකරන යන්ත්‍රය.පොළොව යට වළලාඇත.

※පරික්ෂාකිරීම( *Tenken* ) : විෂබීජ නාශක ටැංකියේ ක්‍රියාකාරීත්වය නිසියාකාරව සිදුවෙනවා දැයි පරීක්ෂා ර බලන්න.

| වැඩි විස්තර දැනගැනීම සඳහා ( විමසීම ) | ලිපිනය | දුරකථන අංකය |
| --- | --- | --- |
| පරිසර සංරක්ෂණ අංශය<br>( *Kankyō Hozenka* ) | 296බන්චි,තොනොදයි,සන්මු නගරය<br>( 296,Tonodai,Sammu-shi ) කවුළු අංක ⑯ | 0475-80-1161 |

< විමසීම් කළ හැකි වේලාවන් > සඳුදා සිට සිකුරාදා දක්කවා පෙරවරු8.30සිට පස්වරු5.15 දක්වා වේලාව තුළ

※සෙනසුරාදා,ඉරිදා,රජයේ නිවාඩු දින සහ දෙසැම්බර් 29වෙනිදා සිට ජනවාරි 3වෙනිදා දක්වා නිවාඩු දින වේ.